# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2072/47 - 2018 මැයි මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2018.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

34 වන වගන්තිය යටතේ වූ නියමය

2016 අංක 8 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 34 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍ය එස්. බී. නාවින්න වන මා විසින් අවශ්‍ය යටිතල පහසුකම්, වැඩ පිළිවෙල සහ තාක්ෂණික ක්‍රමවේද සකස් කරන තුරු, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 6, 9, 14, 16 සහ 17 වන වගන්ති සහ එම පනත යටතේ සාදන ලද සෑම නියෝගයක්ම (1990 නොවැම්බර් මස 20 වන දින *අංක 637/6 දරන ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1990 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝග හැර) ක්‍රියාත්මක වීමේ කාල සීමාව අවසන් වන දිනය වශයෙන් 2016 අගෝස්තු මස 11 වන දින *අංක 1979/40 දරන ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දිනය, 2019.06.30 දින වශයෙන් මෙම නියමය මගින් වෙනස් කරමි.

එස්. බී. නාවින්න,
අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍ය.

2018 මැයි මස 23 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

06 - 477

1A - G 27734 — 17 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*